# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2013 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2013 නොවැම්බර් මස 11 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 නොවැම්බර් මස 15 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිළ : රු. 6.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## 2013 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 නොවැම්බර් මස 11 වන දින]

එල්.ඩී.—ඕ. 27/2012.

## බෞද්ධ විහාර දේවාලගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 34 දරන බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) බෞද්ධ විහාර දේවාලගම් ආඥපනත එහි ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියේ හැර, එහි කවර හෝ තැනක සඳහන් වන ''බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා'' යන යෙදුම වෙනුවට, ''බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා'' යන යෙදුම ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. *318 වන අධිකාරය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— *ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(අ) ''භික්ෂූන් වහන්සේ'' යන අර්ථකථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

''බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා'' යන්නෙන් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල් ධුරය තත්කාලයේ දරන තැනැත්තා අදහස් වන අතර, යම් කොමසාරිස්වරයෙක් ද, නියෝජ්‍ය කොමසාරිස්වරයෙක් ද සහ සහකාර කොමසාරිස්වරයෙක් ද ඊට ඇතුළත් වේ;'' තවද,

(ආ) ''බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා '' යන අර්ථකථනය ඉවත් කිරීමෙන්.

**4.** (1) මේ පිළිබඳ ආරම්භවීමේ දිනයට පෙරාතුවම, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයාගේ සියලුම අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයාගේ අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය. *අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් පැවරීම.*

(2) බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්වරයා විසින් ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ ආරම්භ කරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමට පෙර අවසාන නොවූ ක්‍රියාවක් හෝ නීති කෘත්‍යයක්, බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්-ජනරාල්වරයා විසින් කරගෙන යාම සහ අවසන් කිරීම කළ හැකි ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.